# අධ්‍යාපන අමාත්‍යාංශය - ආදර්ශ පිළිතුරු පත්‍රය

| | |
|---|---|
| 1 | 4. සුජාතාව |
| 2 | 2. සුගත නම් වෙයි. |
| 3 | 1. වීර්යය |
| 4 | 2. සංඥා ස්කන්ධ නමිනි. |
| 5 | 4. පද්මාකාර ජීවිතය ලෙස හැඳින්වේ. |
| 6 | 3. මිරිඟුවකට ය. |
| 7 | 1. ගරුක කර්මය හැඳින්වේ. |
| 8 | 1. උපඝාතක කර්ම යයි. |
| 9 | 4. අරියපර්යේෂණ සූත්‍රයයි. |
| 10 | 2. දෙවන සතියේ දී ය. |
| 11 | 1. 'ධර්ම විනිශ්චය' ග්‍රන්ථය රචනා කිරීම. |
| 12 | 2. තේවිජ්ජ සූත්‍රය |
| 13 | 4. මකුල පර්වතයෙහි ය. |
| 14 | 4. බ්‍රහ්මායු බමුණා ය. |
| 15 | 2. ජේතවනාරාමය හා පූර්වාරාමයයි. |
| 16 | 3. සුප්පිය හා බ්‍රහ්මදත්ත මුල් කරගෙන ය. |
| 17 | 4. අක්කෝධේන ජිනේ කෝධං - අසාධුං සාධුනා ජිනෙ යන්නයි. |
| 18 | 1. ''භව පච්චයා ජාති'' |
| 19 | 2. සළායතන පහළ නොවීමෙන් ස්පර්ශය ඇති නොවේ. |
| 20 | 1. කොසොල් රජතුමා ය. |
| 21 | 3. ථූපාරාම ස්තූපයයි. |
| 22 | 1. නිර්වාණ විනිශ්චය |
| 23 | 2. සුදුසු වේලාවන්හි මංමාවත්වල සැරිසැරීම |
| 24 | 3. කාලාම සූත්‍රයේ ය. |
| 25 | 3. දස සක්විති වත්වල ය. |
| 26 | 2. දේවානම්පියතිස්ස සහ ධර්මාශෝක |
| 27 | 3. ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම ය. |
| 28 | 4. අජාසත්ත සහ ධර්මාශෝක ය. |
| 29 | 2. පැළලුප් නුවර අශෝකාරාමයේ දී ය. |
| 30 | 2. දීඝජාණු කෝලිය පුත්‍රයා ය. |
| 31 | 3. සීල සම්පදාවයි. |
| 32 | 1. පංච සීලය නම් වේ. |
| 33 | 1. මහේශාක්‍ය ව උපදී. |
| 34 | 3. "දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං'' යන්නයි. |
| 35 | 4. උද්ධච්ච කුක්කුච්ච නම් වේ. |
| 36 | 1. වේරංජා නුවරය. |
| 37 | 1. බුත්සරණ නම් වේ. |
| 38 | 3. මඛාදේව ජාතකය හා සස ජාතකය යි. |
| 39 | 4. ඇල්බට් ධර්මසිරි මහතා ය. |
| 40 | 1. කිරිබත් වෙහෙර |
| | |

| | | |
|---|---|---|
| 1 | 1 | බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් ද, රහසින් වත් පව් නොකළ හෙයින් ද සියලු පූජාවන් ලැබීමට සුදුසු වූ හෙයින් ද "අරහං" නම් වෙයි |
| | 2 | දෙවරගම්පළ සිල්වත්තැන, හිරියාලෙ නයිදෙ, දේවේන්ද්‍ර මූලාචරියා |
| | 3 | යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු නොවේ ද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතු ව විඳිය හැකි වේ ද එබඳු ක්‍රියාවල නිරත විය යුතු ය. |
| | 4 | මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා |
| | 5 | සමගියම යහපති |
| | 6 | සමථ භාවනාව, විදර්ශනා භාවනාව |
| | 7 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්කම බෝධිඝරය, අභයගිරියට අයත් රත්නප්‍රාසාරයේ පිහිටි මුරගල |
| | 8 | අනේපිඬු සිටුතුමා අරඹයා |
| | 9 | රාග චරිත, ද්වේෂ චරිත, මෝහ චරිත, ශ්‍රද්ධා චරිත, බුද්ධි චරිත, විතක්ක චරිත |
| | 10 | සම්මුති සත්‍යය හා පරමාර්ථ සත්‍යය |
| | | |
| 2 | 1 | 1. දාන පාරමිතාව (දාන පාරමිතා)<br>2. ශීල පාරමිතාව (සීල පාරමිතා)<br>3. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව (නෙක්ඛම්ම පාරමිතා)<br>4. ප්‍රඥා පාරමිතාව (පඤ්ඤා පාරමිතා)<br>5. වීර්ය පාරමිතාව (විරිය පාරමිතා)<br>6. ක්ෂාන්ති පාරමිතාව (ඛන්ති පාරමිතා)<br>7. සත්‍ය පාරමිතාව (සච්ච පාරමිතා)<br>8. අධිෂ්ඨාන පාරමිතාව (අධිට්ඨාන පාරමිතා)<br>9. මෛත්‍රී පාරමිතාව (මෙත්තා පාරමිතා)<br>10. උපේක්ෂා පාරමිතාව (උපෙක්ඛා පාරමිතා) |
| | 2 | 1 දානය පාරමිතාවක් වීමට නම් තණ්හාවෙන් මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් තොර ව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව තුන්තරා බෝධියේ එක් බෝධියකට පත්වීම සඳහා දන්දීමයි<br>2 තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් තොර ව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතු ව සීලය ආරක්ෂා කිරීම සීල පාරමිතාවයි.<br>3 තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතු ව පංච කාම සම්පත්තියෙන් ඉවත් වීම නෙක්ඛම්ම පාරමිතාවයි.<br>4 තණ්හාවෙන්, මානයෙන්, මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් යුතු ව තම ප්‍රඥාව දියුණු කිරීම ප්‍රඥා පාරමිතාවයි.<br>5 තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් තොර ව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතු ව තමන්ගේත් අනුන්ගේත් අභිවෘද්ධිය පිණිස ගන්නා වූ බලවත් උත්සාහය වීර්ය පාරමිතා නම් වේ.<br>6 තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් තොර ව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතු ව ඉවසීම ප්‍රගුණ කිරීම ඛන්ති පාරමිතාවයි.<br>7 තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතු ව සත්‍යවාදී භාවය ප්‍රගුණ කිරීම සත්‍ය පාරමිතාවයි.<br>8 තණ්හා, මාන හා මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතු ව අධිෂ්ඨානය ප්‍රගුණ කිරීම අධිෂ්ඨාන පාරමිතාවයි.<br>9 තණ්හාවෙන් මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් තොර ව, කරුණාවෙන් හා උපාය කුසලතාවෙන් යුතු ව මෛත්‍රිය සැමට පැතිරවීමෙන් ලබන පුහුණුව මෛත්‍රී පාරමිතාවයි<br>10 තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් තොර ව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතු ව මැදහත් ව කටයුතු කිරීමට පුහුණු වීම උපේක්ෂා පාරමිතාවයි. |
| | 3 | (iii) දැහැමි සමාජයක් බිහි කිරීමට පාරමිතා ධර්ම ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.<br>පාරමිතා ධර්ම බුද්ධත්වය ප්‍රාර්ථනා උතුමන් විසින් පූරණය කරනු ලබන ගුණසමුදායකි.<br>• දානාදී මෙම ගුණ ධර්ම පුහුණු කිරීමෙන් බුදු පසේ බුදු මහ රහත් තත්වයන්ට පත්වීමට ඉවහල්වන්නාක් මෙන්ම දැහැමි මිත්‍රශීලී සමාජයක් බිහිකර ගැනීමට ද ඉවහල් වේ<br>• ලෝභ, ද්වේෂ, මෝහයෙන් තොරව කුසල සිතුවිලි වර්ධනය කර ගැනීමට දානය උපකාරීවේ.<br>• නොකලයුතු අවැඩදායක අයහපත් ක්‍රියාවලින් වැළකීම, වැඩදායක යහපත් ක්‍රියාවල නිරතවීම, සියලු සත්වයින්ට හිතෛෂි වීම, කරුණා මෛත්‍රී දැක්වීම, සානුකම්පිත වීම, සත්‍යවාදී බව, ඉවසීම වැනි ගුණාංග මගින් දැහැමි මිත්‍රශීලී සමාජයක් ඇතිවේ.<br>• මේ අයුරින් දස පාරමිතා ගුණධර්ම පුහුණු කිරීම දැහැමි මිත්‍රශීලී බෝධිසත්ව ආදර්ශ ඇති සමාජයක් බිහිකිරීමට ඉවහල් වේ. |
| | | |

| | | |
|---|---|---|
| 3 | 1 | අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති<br>අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති<br>සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ |
| | 2 | • යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේ ය.<br>• යමෙකු පව් නොකළහොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය.<br>• පිරිසිදුකම හෝ අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිම ය.<br>• එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය. |
| | 3 | • **බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්මපදය සියලු දෙනාට පරිහරණය කළ හැකි** වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයකි.<br>• ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීමට උපදෙස් සපයන, ප්‍රායෝගිකව අදාළ කරගත හැකි අගනා ග්‍රන්ථයක් ලෙස ධම්මපදය සඳහන් කළ හැකිය.<br>• ධම්මපදයේ ගාථා ධර්මයන්හි ඇතුළත් උපදෙස් මගින් හරි වැරදි, හොඳ නරක, පින් පව්, හඳුනා ගැනීමට මග පෙන්වයි.<br>• සිතෙහි සන්සුන් බව ඇතිකර ගැනීම, මනා සිහියෙන් යුතුව කටයුතු කිරීම හා වීර්යවන්තව ක්‍රියා කොට ජීවිතය ජය ගැනීමට උපදෙස් ලබා දෙයි.<br>• සමාජගත ජීවිතයේ දී ඇසුරු කළ යුතු හා නොකළ යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට මග පෙන්වයි.<br>• සහයෝගයෙන් හා සහජීවනයෙන් යුතුව චාම් සරල ජීවිතයක් ගත කිරීමට ඉතා වටිනා උපදෙස් සපයයි.<br>• ශිෂ්‍ය පෞරුෂය නිවරදි ක්‍රියාකාරකම් වලින් ගොඩනගා ගැනීමට ඉතා වටිනා උපදෙස් ලබාදෙයි.<br>• ෂමස්තයක් ලෙස ධම්මපදයෙන් මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට මෙන්ම පරලොව ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් ලබා දෙයි. |
| | | |
| 4 | 1 | 1. අත්ථි සුඛ<br>2. භෝග සුඛ<br>3. අනණ සුඛ<br>4. අනවජ්ජ සුඛ |
| | | |
| | 2 | අත්ථි සුඛය - උත්සාහයෙන් හා දෑතේ ශක්තියෙන් දහඩිය වගුරවමින් ධාර්මික ව උපයා සපයාගත් ධනයක් තමනට ඇතැයි සිතා යමෙක් සතුටු වීම එය අත්ථි සුඛයයි<br><br>භෝග සුඛයයි - උට්ඨාන වීර්යයෙන් දෑතේ මහන්සියෙන් දහඩිය වගුරවා ධාර්මික ව සපයා ගත් ධනය පරිභෝග කිරීමෙන් ලබන සැපය භෝග සුඛයයි.<br><br>අනණ සුඛය -තමන් කිසිදු අයකුට කිසි ම ආකාරයේ ණයක් නැතැයි කියා සිතා සතුටු වීම අනණ සුඛයයි.<br><br>අනවජ්ජ සුඛයයි - නිවැරැදි වූ කාය කර්මයෙන්, නිවැරැදි වූ වචී කර්මයෙන්, නිවැරැදි වූ මනෝ කර්මයෙන් යුතු ව ක්‍රියා කිරීමෙන් සතුටු වීම අනවජ්ජ සුඛයයි. |
| | | |
| | 3 | • බුදු දහමේ උගන්වා ඇති චතුර්විධ සුඛය පුද්ගලයාගේ ලෞකික සැපයට හේතු වෙයි.<br>• "ජීවත් වීමට මිනිසුන්ට ධනය අවශ්‍යයි.<br>• එනිසා ඇතැම් අය අධාර්මිකව ධනය ඉපැයීමට පෙළඹෙයි. එනම් නොකළ යුතු වෙළෙඳාම්, අල්ලස් ගැනීම්, පැහැර ගැනීම්, බිය වැද්දීම් සිදුකර හෝ ධනය ඉපැයීමට පෙළඹෙයි. නමුත් එසේ අධාර්මික ව සාහසික ව පුද්ගලයෙක් ධනය උපයා ගත්ත ද කිසි දවසක ඔහුට මානසික සතුටක් ඇති වෙන්නේ නැත. සමාජයට හා නීතියට බියෙන්, පරලොවට බියෙන් ඔහු ජීවත් වීමට සිදුවෙයි.<br>• සාධාරණ ව ධනය උපයා සපයා ගන්නා පුද්ගලයා කායික හා මානසික යන දෙ අංශයෙන් ම සැප ලබනවා. එනිසා ලෞකික සැපය සඳහා අත්ථි සුඛය මහෝපකාරී වෙයි.<br>• ධනය රැස්කර තබා ගැනීමෙන් පමණක් සැප ලැබෙන්නේ නැහැ. ඒවා තමාගේ මෙන් ම අන්‍යයන්ගේ ද සුව පහසුව ඇති වන ආකාරයට පරිහරණය කළ යුතුයි. |

| | | |
|---|---|---|
| | | • මෙලොව ජීවිතය පමණක් නොවෙයි පරලොව ජීවිතය සැපවත් කර ගැනීමට අවශ්‍ය පින් දහම් කිරීමට ද ධනය වැය කළ යුතුයි.<br>• තම පවුලේ දෙමාපියන්, ඥාතීන් හා අසල්වැසියන් සමග උපයා ගත් ධනය පරිභෝජනය කිරීමෙන් ලැබෙන්නේ සතුටක්. දරුවනේ මම එම සතුට උපරිම වශයෙන් ලබනවා. මෙසේ ධාර්මිකව ධනය වැය කිරීම භෝගසුඛය පුදගලයාගේ සැපයට හේතුවෙයි.<br>• තමන් කිසිදු අයකුට කිසි ම ආකාරයේ ණයක් නැහැයි කියලා හිතලා සතුටු වීමට හැකිනම් අනණ සුඛයයි.<br>• තමනට ලැබෙන දිනපතා හෝ මාසික ආදායම පමණ දනගෙන කටයුතු නොකිරීම පුද්ගලයකුගේ මෙලොව දියුණුවට බාධාවකි. එය සමජීවිකතාවෙන් තොර ව කටයුතු කිරීමකි. එනිසා පුද්ගලයාට සමජීවකතාවෙන් කටයුතු කිරීම අනණ සුඛය සඳහා මහෝපකාරී වන්නා සේම ලෞකික ජීවිතයක් ගතකරන පුද්ගලයාට ණය නොවී ජීවත් වීම සතුටකි.<br>• තුන් දොර හික්මවාගෙන කටයුතු කරන පුද්ගලයා සැබෑ ලෙස සැප ලබයි. අනවජ්ජ සුඛය අපේ අධ්‍යාත්මය සුරක්ෂිත කරන සැපයක්. කය වචනය මනස හික්මවාගෙන ක්‍රියා කිරීමෙන් මෙලොව ලෞකික ජීවිතය සැපවත් කිරීමට උපකාරීවෙයි.<br>• තුන්දොර හික්මවා කටයුතු කරන පුද්ගලයා සමාජයේ කීර්තියට හා ප්‍රශංසාවට ලක්වෙයි. ඔහුව අගය කරයි.<br>• එනිසා චතුර්විධ සැපය පුද්ගලයාගේ සැපවත් ලෞකික ජීවිතයක් ගත කිරීමට උපකාරීවෙයි. |

| | | |
|---|---|---|
| | | |
| | | |
| 5 | 1 | 1. වීරාසන<br>2. පත්මාසන<br>3. භද්‍රාසන |
| | | |
| | 2 | 1. ධ්‍යාන මුද්‍රාව<br>වම් අත්ල මත දකුණු අත්ල පිහිටුවා තිබීමෙන් මෙම මුද්‍රාව අර්ථවත් කෙරේ. අනුරාධපුරයේ ප්‍රසිද්ධ සමාධි පිළිමය ඇතුළු බොහෝ සමාධි පිළිමවල මෙය දැකිය හැකි ය. මෙයින් භාවනානුයෝගී සමාධිගත ඉරියව්ව සංකේතවත් කෙරේ.<br><br>2. අභය මුද්‍රාව<br>දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිග හැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කෙරෙන්නේ අභය මුද්‍රාවයි. ඇතැම් විට අත්ල මඳක් කම්මුල දෙසට හැරුණු ප්‍රතිමා ද මෙම මුද්‍රාවට අයත් ලෙස සැලකේ. අවුකන ප්‍රතිමාව හා ගල් විහාර ප්‍රතිමාව මෙයට නිදසුන් වේ. ලෝක සත්ත්වයාට උරුම ව ඇති සසර බිය දුරු කිරීම මෙයින් පිළිබිඹු කරන බව විද්වත් මතයයි. |
| | | 3. විතර්ක මුද්‍රාව<br>දකුණු අත උඩට නමා දබර ඇඟිල්ල මාපට ඇඟිල්ලේ තුඩ මත තබා කවයක් ලෙස ඇඟිලි දෙක සකසා තිබීම මෙහි විශේෂ ලක්ෂණයයි. මෙමගින් ගැටලු විසඳීමට බුදුරදුන්ගේ යොමු වීම සංකේතවත් කෙරේ.<br><br>4. ධර්ම චක්‍ර මුද්‍රාව<br>ධර්ම චක්‍ර මුද්‍රාව සඳහා අත් දෙක ම භාවිත කෙරේ. පළමු ව දකුණු අත්ල පිටතට හරවා එය පපුවේ මට්ටමට ගෙන එම අතේ මහපට ඇඟිල්ලේ හා දබර ඇඟිල්ලේ තුඩු දෙක ස්පර්ශ වන අයුරින් කවයක් සෑදෙන ලෙස එකට තබාගෙන ඇත. අනතුරුව පපුව ප්‍රදේශයට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් නිරූපිත මුද්‍රාව ධර්ම චක්‍ර මුද්‍රාව වේ. මෙයින් ධර්මය පැහැදිලි කිරීම පෙන්නුම් කෙරේ.<br><br>5. භූමි ස්පර්ශ මුද්‍රාව<br>මෙය හිඳි පිළිමවලට පමණක් ආවේණික මුද්‍රාවකි. හිඳි පිළිමයේ දකුණු දණ හිසට උඩින් තම දකුණු අත්ල ඇතුළට සිටින සේ ඇඟිලි දිග හැර පහතට සිටින ආකාරයට මූර්තිමත් කෙරේ. වම් අත භාවනානුයෝගී ඉරියව්වෙන් තබා ඇත. මෙයින් බුදුරදුන් මාර පරාජයේ දී පොළොව සාක්ෂි දැරීම සංකේතවත් කෙරේ. |

| | | |
|---|---|---|
| | | 6. වරද මුද්‍රාව<br>බොහෝ විට මෙය හිඳි පිළිමවල දැකිය හැකි මුද්‍රාවකි. දකුණු අත පහත් කොට අත්ල උඩු අතට හරවා ඇඟිලි දිගහැර තිබීම මෙම මුද්‍රාවේ ලක්ෂණයයි. වරදානය මේ තුළින් සංකේතවත් කෙරේ. |
| | | |
| | 3 | ශ්‍රී ලංකික කලා ශිල්පීන්ගේ කලා කෞශල්‍යය බුද්ධ ප්‍රතිමා කලාව තුළින් මොනවට ප්‍රකට වේ. බුදුරජාණන් වහන්සේ තුළ වූ මහා කරුණාව මහා ප්‍රඥාව වැනි ආධ්‍යාත්මික සමාධි ගුණ පිළිබිඹුවන අයුරින් ප්‍රතිමා නිර්මාණය කොට ඇත.<br><br>කළු ගල්, කිරිගරුඬ, ඇත් දළ, ලෝහ, දැව, ආදී අමුද්‍රව්‍ය භාවිත කොට ඉතා සියුම් කැටයම් ද සහිතව කලාත්මකව බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට ඇත. විවිධ මුද්‍රා සහ ආසන සහිතව මේවා නිර්මාණය කොට තිබීම විශේෂත්වයයි.<br><br>අනුරාධපුරයේ සමාධි පිළිමය, අවුකන පිළිමය, පොළොන්නරු ගල්විහාරයේ පිළිම නිදසුන්වේ. |
| | | |
| 6 | 1 | 1. සංඝ සමාජය නිකාය වශයෙන් බෙදී ඒ ඒ නිකාය විසින් විවිධාකාරයෙන් බුදු දහම විවරණය කිරීම<br>2. ත්‍රිපිටක පොත්පත් එක්රැස් කිරීම හා ඒවාට සර්වාස්තිවාදී ධර්මයට අනුව අටුවා සම්පාදනය කිරීමේ අවශ්‍යතාව |
| | | |
| | 2 | අනුග්‍රහය දැක්වූ රජතුමා - කණිෂ්ක රජු<br><br>ප්‍රධානත්වය - පාර්ශව හිමි<br><br>සභාපතිත්වය - වසුමිත්‍ර හිමි |
| | | |
| | 3 | 1. සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටකයට විභාෂා නම් සර්වාස්තිවාදී අටුවා ග්‍රන්ථ සම්පාදනය වීම (ඒ අනුව විනය පිටකය සඳහා විනය විභාෂා ද, සූත්‍ර පිටකය සඳහා උපදේශ ශාස්ත්‍රය ද, අභිධර්ම පිටකය සඳහා අභිධර්ම විභාෂා ශාස්ත්‍රය ද සම්පාදනය කෙරුණි.)<br>2. අටුවා ග්‍රන්ථ තඹපත් ඉරුවල ලියවා සෙල්මුවා මංජුසාවල බහා ස්තූපයක තැන්පත් කරමින් ඒවායෙහි සුරක්ෂිතතාව තහවුරු කිරීම<br>3. පාලියෙන් පැවති ත්‍රිපිටක බුද්ධ ධර්මය සංස්කෘත භාෂාවට පරිවර්තනය වීම<br>4. විසිරී පැවති ගුරුකුල එක නිකායක් යටතට ගැනීම නිසා මහායාන සම්ප්‍රදාය ආරම්භ වීම<br>5. මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරය සඳහා ධර්ම දූත පිරිස් යෙදවීම |

| | | |
|---|---|---|
| 7 | 1 | <u>2019. දුටුගැමුණු රජු රජතුමා</u><br>• දුටුගැමුණු රජතුමා රුහුණු රජ පෙළපතට අයත් කාවන්තිස්ස රජුගේ සහ විහාර මහා දේවියගේ වැඩිමහල් පුත්‍රයාය. එතුමාගේ බාල සොයුරා තිස්ස කුමාරයාය.<br>• මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය යන දුටුගැමුණු රජතුමාගේ ආදර්ශපාඨය විය. මෙහි පරමාර්ථය වූයේ දශක කීපයක පටන් විනාශ මුඛයට යමින් පැවති රටේ ස්වාධීනත්වය ආරක්ෂා කරගනිමින් විදේශීය පාලනයෙන් රට මුදාගෙන එක්සේසත් කිරීමයි.<br>• එළාර නම් විදේශීය පාලකයාගෙන් රට මුදාගෙන රට එක්සේසත් කිරීම මෙතුමා කළ විශේෂ කාර්ය විය. භික්ෂූන් වහන්සේලාගේ අවවාද අනුශාසනා අනුව රට පාලනය කිරීම, සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා රුවන්වැලිසෑය, මිරිසවැටිය, ලොවාමහාපාය ඉදිකළේය. එසේම කෘෂිකර්මාන්තය දියුණු කිරීමටද එතුමාගේ කැපී පෙනෙන කාර්යයක් විය. |
| | 2 | ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි "උට්ඨාන සම්පදා" ලෙස හඳුන්වා ඇත්තේ තමන් කරන කවර ම හෝ රැකියාවක් උත්සාහයෙන් දැතේ මහන්සියෙන් දහදිය හෙළා ධාර්මික ව ධාර්මික ක්‍රියා අනුගමනයෙන් ක්‍රියාත්මක කළ යුතු බවයි. මෙහි දී ධාර්මික රැකියා අංශ 06 ක් ද දක්වා තිබේ. ඒවා නම්, |

<table>
<tr><td></td><td></td><td>1. කෘෂි කර්මාන්තය<br>2. වෙළෙඳාම<br>3. ගවයන් රැක බලා ගැනීම<br>4. දුනු ශිල්පය හෙවත් ආරක්ෂක සේවාව<br>5. රාජ්‍ය සේවය<br>6. වෙනත් ශිල්ප කර්මාන්ත</td></tr>
<tr><td></td><td>3</td><td>බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසෙන පියගැට පෙළක ආරම්භයේ දක්නට ලැබෙන අර්ධකවාකාර ගල් පුවරුව හැඳින්වෙන්නේ සඳකඩපහණ නමිනි. පාලියෙන් “අඩ්ඪචන්දපාසාණ” යනුවෙන් හැඳින්වෙයි.<br><br>අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ඒ ඒ යුගවලට අයත් සඳකඩපහණ රැසක් හමු වී ඇති අතර එම නිර්මාණ ඒ ඒ යුගවලට අනන්‍ය ලක්ෂණ ප්‍රකට කරයි. වඩාත් කලාත්මක සඳකඩපහණ නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ විසූ කලාකරුවන්ට ය. දැනට හමු වී ඇති සඳකඩපහණ කිහිපය අතර කලාත්මක බවින් මුල් තැන ගන්නේ අනුරාධපුරයේ බිසෝ මාලිගය අසල ඇති සඳකඩපහණයි.<br><br>මේවායේ කලාත්මක බව තීව්‍ර කරන ප්‍රධාන සාධකය වන්නේ එහි ඇති විසිතුරු කැටයම් ය. මල් ලියකම්වලින් මෙන් ම සත්ත්ව රූපවලින් ද සඳකඩපහණ විසිතුරු වේ. අනුරාධපුර සඳකඩපහණ පිටත සිට ඇතුළත ඇති කැටයම්වල මුලින් ම දක්නට ලැබෙන්නේ ශෛලිගත පලාපෙති මෝස්තරයයි. අනතුරුව ඇත්තේ එකිනෙකා පසුපස දිවයන ඇත්, අස්, සිංහ, ගව යන සතුන් සිව්දෙනායි. ඉන් පසු සංකීර්ණ ලියවැලක් ද අනතුරුව තුඩින් නෙළුම් පොහොට්ටු රැගෙන එකා පසු පස ගමන් කරන හංස පේළියක් ද ඊළඟට නැවත වතාවක් සරල ලියවැලක් ද දක්නට ලැබේ. සඳකඩපහණෙහි මැද ඇත්තේ නෙළුම් මලක අර්ධයකි. මෙම පිළිවෙළ හා කැටයම් සෑම සඳකඩපහණකට ම පොදු නොවේ. පොළොන්නරු යුගයේ සඳකඩපහණෙහි ගව රූපය ඉවත් ව ඇත. එයට හේතුව ලෙස සැලකෙන්නේ මේ වන විට හින්දු ආභාසය ලාංකේය සංස්කෘතියට එකතු වීමයි. මහනුවර යුගයේ සඳකඩපහණ කැටයම්වලින් පමණක් නොව හැඩය අතින් ද වෙනස් වී ඇත. අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණින් භව චක්‍රය අර්ථවත් කෙරෙන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසයි.</td></tr>
<tr><td></td><td>4</td><td>සතර සංග්‍රහ වස්තු<br>සතර සංග්‍රහ වස්තුව නම්<br>1 දානය<br>2 ප්‍රිය වචනය<br>3 අර්ථ චර්යාව<br>4 සමානාත්මතාව<br>දානය<br>පුද්ගලයාගේ චරිත සංවර්ධනය ඇති කරවන හා සමාජ සමඳතා තහවුරු කරන පිළිවෙතකි. දානය හෙවත් පරිත්‍යාගය බෞද්ධයන් ජාති ආගම් ආදී කිසිවක් සලකා සිදුකරන්නක් නොවේ. පිරිසිදු සිතින් ඕනෑම පුද්ගලයෙකුට යම්ක් පරිත්‍යාග කිරීම පිංකමකි. තිරිසින් සතෙකුට වුවද යමක් දීම උතුම් ය.<br><br>ප්‍රිය වචනය<br>යහපත් වචනයයි. එනම් බොරුව, කේලම, හිස්වචන, රළුවචනයෙන් වැළකී ප්‍රියවචන භාවිත කිරීමයි. සත්‍ය ප්‍රකාශ කිරීමත්, ඔවුනොවුන් භේද කිරීමෙන් වැළකී සමගිය දියුණු කිරීමත්, අර්ථවත් දේ කථා කිරීමත්, කනට මිහිරි කථා බස් ඇති බවත් මෙයින් අර්ථවත් වේ.<br>අර්ථ චර්යාව<br>අනුනගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීමයි. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සිව්බඹ විහරණයෙන් යුක්තව ජනතාවට අර්ථවත් සේවාවක් සපයමින් කටයුතු කිරීමයි.<br>සමානාත්මතාව<br>සියලු සත්ත්වයන් පිළිබඳ සම සිතින් කටයුතු කිරීමයි. විවිධ ජාති, ආගම්, භාෂා අනුව වර්ග වී සිටින සියලු දෙනා වෙත අයිතිවාසිකම් හා නිදහස සුරක්ෂිත වන ලෙෂ සමානව කටයුතු කිරීමයි.<br><br>සතර සංග්‍රහ වස්තු රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් ලෙස ද භාවිත කළ හැකි ය.</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
</table>